කෙනෙකු දිවි අහිමි කරගත් ආකාරය ප්‍රමුඛත්වයකින් දැක්වීම, දිවි අහිමි කරගත් ආකාරය දැක්වීම සහ දිවි අහිමි කරගත් ආකාරය දීර්ඝ ලෙස විස්තර කිරීම මගින්, අවදානමට ලක්විය හැකි තත්වයක සිටිනා (vulnerable) පුද්ගලයින් තුළ දිවි අහිමි කරගැනීමට දක්වන නැඹුරුතාවයන් වර්ධනය කිරීමට බලපෑ හැකි බව ඒ පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශනයන් මගින් පැවසේ. එමෙන්ම, එවැනි පුවත් සමගින් උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් පවතින අයෙකුගේ දිවි බේරාගැනීමට හැකියාවක් ලැබෙනු ඇත.

පෙබරවාරි 15 සහ 16, 2022 දිනයන්හි මාධ්‍ය තුළ වාර්තා වූ, පිළියන්දල සිදුවූ දිවි අහිමි කරගැනීමේ හා දිවි අහිමි කරගැනීමට තැත් කිරීමේ ද්විත්ව සිදුවීමක් වාර්තා කිරීමේදී යටකී මාධ්‍ය මාර්ගෝපදේශනයන් කඩවී ඇති අයුරු පහත සටහන ඔස්සේ දැක්වේ. මෙම පුවත එම දිනයන්හි ඉංග්‍රීසි පුවත්පත්වල පළ වී නොතිබුණි.

1) දිවි අහිමි කරගැනීම් සමාජ සෞඛ්‍ය ගැටළුවක් ලෙසින් වාර්තා කළ යුතු නමුත්, එහිදී එම පුවත් වාර්තාවන් ඔස්සේ තවත් අයෙකුට සිදුවිය හැකි සෘණාත්මක බලපෑම අවම කරගැනීමට මාධ්‍ය සෑම සියළු උත්සාහයක්ම දැරිය යුතු නොවන්නේ ද?

2) ඒ සඳහා, දිවි අහිමි කරගැනීම් පිළිබඳ සිදුවීම් වාර්තා කිරීමේදී, මාධ්‍ය ආචාර ධර්ම නිර්දේශයන්ට අනුකූල වීම ආචාර මාධ්‍ය වගකීමක් නොවන්නේ ද?

මෙම දිවි අහිමි කරගැනීම් පිළිබඳ මාධ්‍ය මාර්ගෝපදේශනයන් කඩවීම් පිළිබඳ ඔබේ අදහස කුමක්ද?

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

මූලාශ්‍ර:
https://apps.who.int/.../WHO-MSD-MER-17.5-eng.pdf...
https://media.samaritans.org/.../Guidance_for_reporting...